ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියාවේ අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලාංකික හින්දි භාෂා සිසුන්ට පූර්ණ ශිෂ්‍යත්ව 36ක්</u>

ඉන්දීය රජයේ ශිෂ්‍යත්ව යටතේ ඉන්දියාවේ හින්දි භාෂාව හැදෑරීම සඳහා ශ්‍රී ලාංකික සිසු සිසුවියන් තිස් හය දෙනෙකු තෝරාගෙන ඇත. ඉන්දීය රජය ඔවුන්ගේ ගුවන් ගමන් ගාස්තු, අධ්‍යයන ගාස්තු සහ ඉන්දියාව තුළ ජීවන වියදම සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය ලබා දේ. මෙම සිසු සිසුවියන් පිරිස 2024 අගෝස්තු සිට 2025 මැයි දක්වා අග්‍රා හි කේන්ද්‍රීය හින්දි සංස්ථාන් හෙවත් මධ්‍යම හින්දි ආයතනයේ දී මාස නවයක පාඨමාලාවක් හදාරනු ඇත.

2. 2024 ජූලි 25 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඉන්දියාවට පිටත් වන මෙම සිසු සිසුවියන් හමු වී කතාබහක නිරත විය. මහ කොමසාරිස්තුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සියවස් ගණනාවක් පැරණි සංස්කෘතික, භාෂාමය, සාහිත්‍යමය සහ ආගමික බැඳීම් ශක්තිමත් කිරීමෙහිලා හින්දි භාෂාවේ සහ සාහිත්‍යයේ භූමිකාව ඉස්මතු කළේය. හින්දි සහ සිංහල වචන අතර සම්බන්ධතාවය මෙන්ම වචනවල මූලය ද සාකච්ඡා කරන ලදී. මහ කොමසාරිස් ජා

මහතා ඉන්දියාවේ අධ්‍යයන කටයුතු සඳහා පිටත්ව යන ශිෂ්‍යත්වලාභීන්ට සිය සුබ පැතුම් එක් කළේය.

3. කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථයන් සය දෙනෙකු ද ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ අනුරාධපුර රජරට විශ්ව විද්‍යාලයෙන් ශිෂ්‍යත්වලාභීන් සිව් දෙනෙකු බැගින් ද කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය, බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය සහ මාතර විශ්ව විද්‍යාල විද්‍යායතනයෙන් දෙදෙනෙකු බැගින් ද ජේතවනාරාම බෞද්ධ ආශ්‍රමයෙන් තිදෙනෙකු ද වන පරිදි ශිෂ්‍යත්වලාභීන් තෝරා ගන්නා ලදී.

4. ශ්‍රී ලංකාවේ සිසුන් සහ ජනතාව හින්දි භාෂාවට මහත් සේ ඇළුම් කරන අතර ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පාසල් සහ විශ්ව විද්‍යාල ඇතුළු ආයතන 100ක හින්දි භාෂාව උගන්වනු ලැබේ.

5. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් මෙම ශිෂ්‍යත්ව 2011 වසරේ සිට සම්බන්ධීකරණය කරනු ලැබේ. පසුගිය වසර 13 පුරා ශ්‍රී ලාංකික සිසුන් 170කට අධික සංඛ්‍යාවක් සඳහා “හින්දි භාෂාව ප්‍රචලිත කිරීම” යන තේමාව යටතේ මෙම ශිෂ්‍යත්ව පිරිනමා ඇත. මෙම වසරේදී වැඩිම සිසුන් සංඛ්‍යාවක් තෝරා ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවෙනි. හින්දි භාෂාව, සාහිත්‍යය සහ සිනමාව ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහශ්‍ර වර්ෂ ගණනාවක් පැරණි ශිෂ්ටාචාරමය බැඳීම් වඩාත් ගැඹුරු කිරීමෙහි ලා තවදුරටත් වැදගත් භූමිකාවක් සිදු කරනු ඇත.

***

***කොළඹ***
***2024 ජූලි 25***